$$\Delta S^\circ = \frac{48.4\ \text{kJmol}^{-1}}{1000\ \text{K}}$$

$$= \frac{48.4 \times 1000\ \text{Jmol}^{-1}}{1000\ \text{K}}$$

$$= 48.4\ \text{JK}^{-1}\text{mol}^{-1}$$

පිළිතුර 5

---

24. සාන්ද්‍ර HNO_3/ සාන්ද්‍ර H_2SO_4 මඟින් බෙන්සීන් නයිට්‍රෝකරණ යන්ත්‍රණයේ දී නිවැරදි පියවරයක් දක්වන්නේ පහත සඳහන් කුමකින් ද?

(1)



(2)



(3)



#ANYy Science
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

(4)



(5)



- සාන්ද්‍ර සල්පියුරික් හා සාන්ද්‍ර නයිට්‍රික් අම්ල මිශ්‍රණයක් මගින් බෙන්සින් නයිට්‍රොකරණය වේ.



- බෙන්සින් වලයට පහර දෙන ඉලෙක්ට්‍රොෆයිලය නයිට්‍රෝනියම් අයනය (NO_2^+) යි. එම අයනය පහත දැක්වෙන ආකාරයට ජනනය වේ.

$$H_2SO_4 + H-\ddot{\underset{..}{O}}-NO_2 \longrightarrow HSO_4^- + H-\overset{+}{\underset{|\atop H}{O}}-NO_2 \longrightarrow H_2O + NO_2^{\oplus} + HSO_4^-$$

- මෙම NO_2^+ අයනය බෙන්සින් වලයට පහර දීමෙන් අතරමැදි එලයක් වන බෙන්සො නයිට්‍රෝනියම් අයනය සාදයි.



බෙන්සො නයිට්‍රෝනියම්

- මෙම බෙන්සො නයිට්‍රෝනියම් අයනය පහත පරිදි සම්ප්‍රයුක්ත ලෙස ස්ථායි වේ.



#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

❖ අවසානයේ දි මාධ්‍යයේ පවතින HSO_4^- මගින් මෙසේ ස්ථායි වූ නයිට්‍රෝනියම් අයනයෙන් ප්‍රෝටෝනයක් (H^+) ඉවත් කර නයිට්‍රෝ බෙන්සින් සාදයි.



මෙය ඉලෙක්ට්‍රොෆිලක ආදේශ ප්‍රතික්‍රියාවකි. පිළිතුර 4

---

25. 

ඉහත සඳහන් ප්‍රතික්‍රියා අනුපිළිවෙළෙහි **X** සහ **Y** හි ව්‍යුහ පිළිවෙළින් වනුයේ,

(1) 

(2) 

(3) 

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ඔබ ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

(4)



(5)



- NaBH$_4$ මෘදු ඔක්සිහාරකයකි. මෙමගින් ඔක්සිහරණය කරන්නේ කාබනිල් සංයෝග (ඇල්ඩිහයිඩ හා කීටෝන) පමණි. මෙම ඔක්සිහරණයෙන් ලැබෙන ඵලය ජල විච්ඡේදනයෙන් මධ්‍යසාරය බවට පත් වේ.



- නමුත්, LiAlH$_4$ මගින් කාබනිල් සංයෝග ඇතුළු –COOH, –COOR, –CONH$_2$, –CO–X, –NO$_2$ හා –CN යන සියළුම කාණ්ඩ ඔක්සිහරණය කරයි.
- ප්‍රශ්නයෙහි සඳහන් සංයෝග මත NaBH$_4$ හි ක්‍රියාව පහත දැක්වේ.



X ඵලය

- ග්‍රිනාඩ් ප්‍රතිකාරකය ප්‍රෝටෝන දායක කාණ්ඩ සමග පහත ආකාරයට ප්‍රතික්‍රියා කරයි. (H_2O, R–OH, R–COOH, NH_3 ආදිය ප්‍රෝටෝන දායකයන් ලෙස ක්‍රියා කරයි.)

උදා:-

$$RMgX + H_2O \longrightarrow RH + MgX(OH)$$

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

$$RMgX + R'-OH \longrightarrow RH + MgX(OR')$$
$$RMgX + R'-COOH \longrightarrow RH + MgX(OOCR')$$
$$RMgX + NH_3 \longrightarrow RH + MgX(NH_2)$$

⌖ x ඵලය ලෙස ලැබෙන සංයෝගයෙහි $-COOH$ කාණ්ඩය හා $-OH$ කාණ්ඩය ප්‍රෝටෝන දායක කාණ්ඩ වේ. x සමග CH_3MgBr ප්‍රතික්‍රියා කරන්නේ පහත ආකාරයෙනි.



පිළිතුර 1

26. $(NH_4)_2CO_3(s)$, $(NH_4)_2Cr_2O_7(s)$ හා $NH_4NO_3(s)$ රත් කළ විට ලැබෙන නයිට්‍රජන් අඩංගු සංයෝග පිළිවෙළින් වනුයේ,

(1) NH_3, N_2 හා NO_2
(2) N_2O, N_2 හා NH_3
(3) NH_3, N_2 හා N_2O
(4) N_2, N_2O හා NH_3
(5) N_2, NH_3 හා N_2O

⌖ NH_4NO_3, NH_4NO_2 හා $(NH_4)_2Cr_2O_7$ හැර අනෙකුත් ඇමෝනියම් අයන රත්කළ විට ඇමෝනියා වායුව අනුරූප අම්ලය ලබා දෙයි.

උදා:-

$$NH_4Cl(s) \longrightarrow NH_3(g) + HCl(g)$$
$$(NH_4)_2SO_4(s) \longrightarrow 2NH_3(g) + H_2SO_4(g)$$
$$(NH_4)_2CO_3(s) \longrightarrow 2NH_3(g) + \underbrace{H_2O(g) + CO_2(g)}_{H_2CO_3\text{ හි වියෝජන ඵල}}$$

⌖ නමුත් NH_4NO_3, NH_4NO_2 හා $(NH_4)_2Cr_2O_7$ පමණක් රත්කිරීමෙන් NH_3 ලබා නොදෙයි.

$$NH_4NO_2(s) \longrightarrow N_2(g) + 2H_2O(g)$$
$$NH_4NO_3(s) \longrightarrow N_2O(g) + 2H_2O(g)$$
$$(NH_4)_2Cr_2O_7(s) \longrightarrow N_2(g) + 4H_2O(g) + Cr_2O_3(s)$$

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot
උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

27. සන්තෘප්ත AgCl ද්‍රාවණයක් හා AgCl(s) අඩංගු බීකරයක Zn කූරක් හා Ag කූරක් රූපයේ දැක්වෙන පරිදි ගිල්වා ලෝහ කූරු දෙක සන්නායකයක් මඟින් සම්බන්ධ කළ විගස පහත සඳහන් කුමක් සිදු වේ ද?

$$Zn^{2+}(aq) + e \rightarrow Zn(s) \quad E^\circ = -0.76\ V$$
$$Ag^{+}(aq) + e \rightarrow Ag(s) \quad E^\circ = 0.80\ V$$



(1)	Zn දිය වේ,	Ag තැන්පත් වේ,	AgCl(s) දිය වේ.
(2)	Zn දිය වේ,	Ag දිය වේ,	AgCl(s) දිය වේ.
(3)	Zn දිය වේ,	Ag දිය වේ,	AgCl(s) තැන්පත් වේ,
(4)	Zn තැන්පත් වේ.	Ag දිය වේ,	AgCl(s) දිය වේ.

(5) ද්‍රාවණයෙහි ක්ලෝරයිඩ සාන්ද්‍රණය අඩු වේ.

මෙහි සඳහන් ඇටවුම රසායනික කෝෂයක් ලෙස හැසිරේ. Ag ඉලෙක්ට්‍රෝඩයට වඩා Zn ඉලෙක්ට්‍රෝඩයෙහි ඉලෙක්ට්‍රෝඩ විභවය (E^o) විශාලය. එබැවින් මෙහි Zn ඇනෝඩය ලෙසත් Ag කැතෝඩය ලෙසත් ක්‍රියා කරයි.

ඇනෝඩ ප්‍රතික්‍රියාව $Zn(s) \longrightarrow Zn^{+2}(aq) + 2e$

කැතෝඩ ප්‍රතික්‍රියාව $2\ Ag^{+}(aq) + 2e \longrightarrow 2\ Ag(s)$

කෝෂ ප්‍රතික්‍රියාව $Zn(s) + 2\ Ag^{+}(aq) \longrightarrow Zn^{+2}(aq) + 2Ag(s)$

ඉහත ඇනෝඩ ප්‍රතික්‍රියාවට අනුව Zn කූර දියවී (ඔක්සිකරණය වී) Zn^{2+} අයන ද්‍රාවණයට එක් වේ. කැතෝඩ ප්‍රතික්‍රියාවේ දී Ag^{+} අයන ඔක්සිහරණය වී Ag පරමාණු බවට පත් වෙමින් Ag කූර මත තැන්පත් වේ.

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

- මේ අනුව Zn කූර දිය වේ හා Ag තැන්පත් වේ යන්න නිවැරදි ප්‍රතිචාරයෙහි සඳහන් විය යුතුය.

- මෙම ද්‍රාවණය පතුලේ AgCl(s) පවතී. මෙය මද වශයෙන් ද්‍රාව්‍ය අයනික සංයෝගයකි. එය ද්‍රාවණයෙහි ඇති Ag^+ හා Cl^- සමග පහත සමතුලිතතාවයෙහි පවතී.

$$AgCl(s) \rightleftharpoons Ag^+(aq) + Cl^-(aq)$$

- සමතුලිත පද්ධතියක් ලේචැටලියර් මූලධර්මයට අනුව ක්‍රියා කරයි.

කැතෝඩ ප්‍රතික්‍රියාව අනුව ද්‍රාවණයෙහි වූ Ag^+ අයන Ag(s) ලෙස Ag කූර මත තැන්පත් වෙයි. මෙය ද්‍රාවණයෙහි වූ Ag^+ සාන්ද්‍රණය අඩු වීමට බලපායි. ද්‍රාවණයෙහි Ag^+ සාන්ද්‍රණය අඩු වීම AgCl(s) හි ඉහත දක්වා ඇති සමතුලිතය බිඳ වැටීමට බලපායි. ලේචැටයිලර් මූලධර්මයට අනුව ද්‍රාවණයෙහි සිදුවන Ag^+ අයන සාන්ද්‍රණයෙහි අඩු වීම අවම කිරීම සඳහා AgCl ඝනය Ag^+ හා Cl^- බවට පත් වෙමින් ද්‍රාවණය වෙයි. එනම් මෙම කෝෂ ප්‍රතික්‍රියාව සිදුවන අතර තුර ද්‍රාවණයෙහි වූ AgCl ඝනය දියවේ. පිළිතුර 1

---

28. පහත දැක්වෙන ප්‍රතික්‍රියා අනුපිළිවෙළෙහි P සහ R හි ව්‍යුහ පිළිවෙළින් වනුයේ,

$$C_6H_5C{\equiv}CH \xrightarrow{Hg^{2+}/\text{ තනුක } H_2SO_4} P \xrightarrow[\text{සාන්ද්‍ර HCl}]{Zn/Hg} Q$$

1. $C_6H_5-C(OH)=CH_2$, $C_6H_5CH=CH_2$
2. $C_6H_5-CH=CH(OH)$, $C_6H_5CH=CH_2$
3. $C_6H_5-C(=O)-CH_3$, $C_6H_5-CH(OH)-CH_3$
4. $C_6H_5-C(=O)-CH_3$, $C_6H_5CH_2CH_3$

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

5. 

Hg^{2+}/ තනුක H_2SO_4 සමග ක්‍රියාවේ දී ඇල්කයිනවලට ජල අණුවක් ආකලනය වී ඊනෝලයක් සාදයි.

උදා:- 

ඊනෝලය

ඊනෝලය අස්ථායි වේ. එය ක්ෂණිකව ප්‍රතිසංවිදානය වී ඇල්ඩිහයිඩයක් හෝ කීටෝනයක් (එනම් කාබොනිල් සංයෝගයක්) බවට පත්වේ. එසේ වන්නේ >C=O කාණ්ඩයෙහි ඉහළ ස්ථායිතාවය හේතුවෙනි.

උදා:- 

මේ අනුව ඇලිකයින Hg^{2+}/ තනුක H_2SO_4 සමග ප්‍රතික්‍රියා කර ඇල්ඩිහයිඩ හෝ කීටෝන ඵල වශයෙන් ලබා දෙයි. මෙහි දි ඇල්කයිනයට ජලය අණුව ආකලනය වීමේ දි එය සිදුවන්නේ මාකොනිකොප් නියමයට අනුව සිදු වේ.



ඉහත දි P වශයෙන් ලැබෙන කීටෝනය Zn/ Hg / සාන්ද්‍ර HCl සමග හයිඩ්‍රොකාබන බවට ඔක්සිහරණය වෙයි. මෙම ඔක්සිහරණය ප්‍රතික්‍රියාවෙන් කාබන් කාබන් බහුබන්ධන ප්‍රතිකාරකය මගින් ඔක්සිහරණය නොවේ.

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot



පිළිතුර 4

29. පහත සඳහන් කුමන වගන්තිය බහුඅවයවක පිළිබඳ ව වැරදි ද?
(1) බේක්ලයිට් තාප ස්ථාපන බහුඅවයවයකි.
(2) ටෙෆ්ලෝන් තාප සුවිකාර්ය බහුඅවයවයකි.
(3) නයිලෝන් 6,6 සෑදී ඇත්තේ 1,6-ඩයිඇමයිනොහෙක්සේන් සහ හෙක්සේන්ඩයිඔයික් අම්ලය අතර ආකලන බහුඅවයවීකරණය මගිනි.
(4) ටෙරිලීන් සෑදී ඇත්තේ එතිලීන් ග්ලයිකෝල් සහ ටෙරිතැලික් අම්ලය අතර සංඝනන බහුඅවයවීකරණය මගිනි.
(5) ස්වාභාවික රබර් *cis*-පොලිඅයිසොප්‍රීන් දාමවලින් සමන්විත ය.

නයිලෝන් 6,6 සෑදෙන්නේ ආකලන බහුඅවයවවීකරණයෙන් නොව සංඝණන බහුඅවයවීකරණයෙන් වේ. 2012, 32 ප්‍රශ්නය බලන්න. පිළිතුර 3

30. $S_2O_3^{2-}(aq) + 2H^+(aq) \rightarrow H_2O(l) + SO_2(g) + S(s)$
යන ප්‍රතික්‍රියාවෙහි $S_2O_3^{2-}$ අනුබද්ධයෙන් පෙළ (m) සෙවීම සඳහා පරීක්ෂණයක් සිදු කරන ලදී. අම්ල ද්‍රාවණයකට 0.01 mol dm^{-3} $S_2O_3^{2-}$ විවිධ පරිමාවන් (v) එකතු කරමින් ප්‍රතික්‍රියාවෙහි ආරම්භක ශීඝ්‍රතාව (R) මනින ලදී. ප්‍රතික්‍රියා මිශ්‍රණයෙහි H^+ සාන්ද්‍රණය නියතව පවත්වා ගත් නමුත් මුළු පරිමාව (V) වෙනස් වීමට ඉඩ හරින ලදී. ප්‍රතික්‍රියාවෙහි ආරම්භක ශීඝ්‍රතාව පිළිබඳ ව පහත සඳහන් කුමන සම්බන්ධය නිවැරදි වේ ද?

(1) $R \propto \left(\frac{v}{V}\right)^m$ (2) $R \propto v^m$ (3) $R \propto v^{\frac{1}{m}}$
(4) $R \propto \left(\frac{v}{V}\right)^{\frac{1}{m}}$ (5) $R \propto V^m$

⌖ සාන්ද්‍රණය $(C) = \frac{\text{මවුල ගණන } (n)}{\text{පරිමාව } (V)}$

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

$nC = V$

සාන්ද්‍රණය නියත විට $C \propto V$ වේ.

අම්ල ද්‍රාවණයට 0.01 $mol dm^{-3}$ $S_2O_3^{2-}$ විවිධ පරිමාවන් (v) එකතු කරන බව සඳහන් වේ. සාන්ද්‍රණය නියත බැවින් එකතු කරන ලද $S_2O_3^{2-}$ මවුල ගණන එහි පරිමාවට සමානුපාතික වේ.

එකතු කරන ලද $S_2O_3^{2-}$ මවුල ගණන(n) $\propto$ v

දැන් අම්ල ද්‍රාවණයට යම් $S_2O_3^{2-}$ පරිමාවක් (v) එකතු කළ පසු ප්‍රතික්‍රියා මිශ්‍රණයේ අඩංගු වන ආරම්භක $S_2O_3^{2-}$ මවුල ගණන (n) එහි එකතු කළ පරිමාවට සමානුපාත වන බැවින් එහි ආරම්භක සාන්ද්‍රණය පහත පරිදි ලබා ගත හැකිය.

ප්‍රතික්‍රියා මිශ්‍රණයේ ආරම්භක

$$S_2O_3^{2-} \text{ සාන්ද්‍රණය} = \frac{\text{එකතු කළ } S_2O_3^{2-} \text{ මවුල ගණන (n)}}{\text{ප්‍රතික්‍රියා මිශ්‍රණයේ මුළු පරිමාව (V)}}$$

එකතු කරන ලද $S_2O_3^{2-}$ මවුල ගණන(n) $\propto$ v බැවින්

$$\text{ප්‍රතික්‍රියා මිශ්‍රණයේ ආරම්භක } S_2O_3^{2-} \text{ සාන්ද්‍රණය} = \frac{v}{V}$$

$$\text{ශීඝ්‍රතාවය} \propto [S_2O_3^{2-}]^m$$

$$\text{ශීඝ්‍රතාවය} \propto \left(\frac{v}{V}\right)^m$$

$$R \propto \left(\frac{v}{V}\right)^m$$

පිළිතුර 1

31. දුබල අම්ලයක් (නියත පරිමාවක්) හා ප්‍රබල හස්මයක් අතර අනුමාපනයක් සලකන්න. පහත සඳහන් කුමක් / කුමන ඒවා දුබල අම්ලයෙහි සාන්ද්‍රණයෙන් ස්වායත්ත වේ ද?
(a) සමකතා ලක්ෂ්‍යයේ දී pH අගය.
(b) අන්ත ලක්ෂ්‍යය කරා ළඟා වීමට අවශ්‍ය ප්‍රබල හස්මයෙහි පරිමාව.
(c) දුබල අම්ලයෙහි විඝටන නියතය.
(d) අනුමාපන ප්ලාස්කුවෙහි ඇති ද්‍රාවණයේ $[H^+] \times [OH^-]$ අගය.

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

- අනුමාපන ප්‍රතික්‍රියාව සම්පූර්ණ වන අවස්ථාව සමකතා ලක්ෂය වේ. මෙම ප්‍රශ්නයෙහි නම් දුබල අම්ලය, ප්‍රබල භෂ්මය මගින් හරියටම උදාසීන වී අවසන් වන අවස්ථාව වේ.

- උදාහරණයක් ලෙස CH_3COOH දුබල අම්ලය හා NaOH ප්‍රබල භෂ්මය අතර අනුමාපනය සළකමු. මෙහි සමකතා ලක්ෂයේ දී පහත ප්‍රතික්‍රියාව සම්පූර්ණ වේ.

$$CH_3COOH + NaOH \longrightarrow CH_3COONa + H_2O$$

එනම් සමකතා ලක්ෂයේ දී ප්‍රතික්‍රියා මිශ්‍රණය තුළ පවතින්නේ CH_3COONa ලවණය හා H_2O පමණි. CH_3COONa ජලීය ද්‍රාවණය තුළ දි සම්පූර්ණයෙන් ම විඝටනය වී පවතී.

$$CH_3COOH + NaOH \longrightarrow CH_3COONa + H_2O$$

සමකතා ලක්ෂයේ දී ප්‍රතික්‍රියා මිශ්‍රණය තුල පවතින CH_3COO^- පහත ආකාරයට ජලවිච්ඡේදනය වි පවති.

$$CH_3COO^- + H_2O \rightleftharpoons CH_3COOH + OH^-$$

ජලවිච්ඡේදන ඵල වන්නේ CH_3COOH හා OH^- වේ. CH_3COOH දුබල අම්ලයක් බැවින් එය නැවත විඝටනයෙන් සෑදෙන H^+ අයන ප්‍රමාණය කුඩාය. එබැවින් ද්‍රාවණය තුල $[H^+] < [OH^-]$ වේ. එබැවින් ප්‍රතික්‍රියා මිශ්‍රණයේ PH අගය POH අගයට වඩා කුඩා වේ. ඉහත සමතුලිතය දකුණට බර විම වැඩි වුවහොත් PH අගයට කුමක් සිදු වේ ද? එවිට ද්‍රාවණය තුල OH^- සාන්ද්‍රණය තවදුරටත් වැඩි වේ. $[H^+] \times [OH^-]$ නියතයක් වන බැවින් (උෂ්ණත්වය නියත විට) H^+ සාන්ද්‍රණය තවදුරටත් අඩු වේ. එවිට PH අගය ද පෙරට වඩා අඩු වේ. මේ අනුව ඉහත සමතුලිතය දකුණට යොමු වන ප්‍රමාණය වැඩි වන විට ප්‍රතික්‍රියා මිශ්‍රණයේ PH අගය අඩු වේ.

- ඉහත සමතුලිතයේ CH_3COO^- සාන්ද්‍රණය වැඩි වන තරමට (ලේචැටලියර් මූලධර්මයට අනුව) සමතුලිතතාව දකුණට යොමු වේ. CH_3COOH හ සාන්ද්‍රණය වැඩි කරන තරමට CH_3COO^- සාන්ද්‍රණය වැඩි වේ. එනම් දුබල අම්ලයේ සාන්ද්‍රණය වැඩි කරන තරමට මෙම සමතුලිතය දකුණට යොමු වන ප්‍රමාණය වැඩි වේ. එවිට සමකතා ලක්ෂයේ දි PH අගය අඩු වන ප්‍රමාණය ද ඉහළ යයි. එනම් දුබල අම්ල - ප්‍රබල භෂ්ම අනුමාපනයක දි සමකතා ලක්ෂයේ PH අගය දුබල අම්ලයේ සාන්ද්‍රණයෙන් ස්වායක්ත නොවේ. (a) ප්‍රතිචාරය අසත්‍ය වේ.

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

- අනුමාපනයක දී දර්ශක මගින් වර්ණ විපර්යාසයක් සිදු වන අවස්ථාව අන්ත ලක්ෂය නමින් හැඳින්වේ. මෙම අනුමාපනය සඳහා යොදා ගන්නා දුබල අම්ලයෙහි සාන්ද්‍රණය වෙනස් කරන විට අන්ත ලක්ෂය කරා ළඟා වීමට අවශ්‍ය ප්‍රබල භස්ම පරිමාව වෙනස් වේ. (b) ප්‍රතිචාරය ද අසත්‍ය වේ.
- දුබල අම්ලයෙහි විඝටන නියතය (K_a) වෙනස් වන්නේ උෂ්ණත්වය මත පමණි. (c) සත්‍ය වේ.
- $[H^+] \times [OH^-]$ ගුණිතයේ අගය උෂ්ණත්වය මත පමණක් රඳා පවතී. (d) සත්‍ය වේ. පිළිතුර 3

32. **පහත දී ඇති අණුව පිළිබඳ ව පහත කුමන වගන්තිය / වගන්ති සත්‍ය වේ ද?**

$$\underset{a}{CH_3}-\underset{b}{C}\equiv\underset{c}{C}-\underset{d}{CHO}$$

(a) කාබන් පරමාණු හතරම එකම තලයේ පිහිටයි.

(b) $C_d - H$ සහ $C_d - C_c$ බන්ධන අතර කෝණය දළ වශයෙන් 120° වේ.

(c) C_b සහ C_c අතර σ –බන්ධන දෙකක් සහ π –බන්ධනයක් ඇත.

(d) C_b සහ C_c අතර σ –බන්ධනයක් සහ π –බන්ධන දෙකක් ඇත.



මෙම අණුවේ එක් එක් කාබන් පරමාණුවක් වටා ඇති σ බන්ධන ගණන, එක් එක් කාබන් පරමාණුවේ මුහුම්කරණය හා එක් එක් කාබන් පරමාණු වටා ඇති σ බන්ධන අතර බන්ධන කෝණය පහත වගුවේ දැක්වේ.

	C_a	C_b	C_c	C_d
σ බන්ධන ගණන	4	2	2	3
මුහුම්කරණය	SP^3	SP	SP	SP^2
බන්ධන කෝණය	109.5°	180°	180°	120°

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

C වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය	චතුස්තලීය	රේඛීය	රේඛීය	තලීය ත්‍රිකෝණාකාර

- C_b හා C_c SP මුහුම්කරණයට භාජනය වී ඇති බැවින් එම පරමාණු වටා ඇති බන්ධන රේඛීයව පිහිටයි.



- එබැවින් මෙම අණුවේ කාබන් සැකිල්ල රේඛීය වේ.



- එනම් කාබන් පරමාණු 4 ම එකම තලයේ පිහිටයි. (a) සත්‍ය වේ.

- C_d SP^2 මුහුම්කරණයට භාජනය වී පවතී. එබැවින් C_d වටා වූ බන්ධන තලීය ත්‍රිකෝණාකාරව පිහිටයි. එවිට ඒ වටා වූ බන්ධනවල කෝණ 120° ක් ගනී. (b) සත්‍ය වේ.



- C_b හා C_c අතර ඇත්තේ ත්‍රිත්ව බන්ධනයකි. ත්‍රිත්ව බන්ධනයක පවතින්නේ σ බන්ධන 1 ක් සහ π බන්ධන 2කි. (c) අසත්‍ය වේ. (d) සත්‍ය වේ. පිළිතුර 5

---

33. Na_2CO_3 නිෂ්පාදනය පිළිබඳ ව සත්‍ය වන්නේ පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති ද?
   (a) භාවිතා කරන එක අමුද්‍රව්‍යයක් CO_2 වේ.
   (b) NH_3 වලින් සන්තෘප්ත ජලීය NaCl හා CO_2 අතර ප්‍රතික්‍රියාව තාපාවශෝෂක වේ.
   (c) නිෂ්පාදන ක්‍රියාවලිය අදියර පහකින් සමන්විත වේ.
   (d) ක්‍රියාවලියේ දී භාවිත වන NH_3 වැඩි ප්‍රමාණයක් නැවත ලබාගත හැක.

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

❖ Na_2CO_3 නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය වශයෙන් සාන්ද්‍ර NaCl, CO_2 හා NH_3 යොදා ගනී.

❖ NH_3 වලින් සංතෘප්ත NaCl හා CO_2 අතර සමස්ථ ප්‍රතික්‍රියාව තාපදායක වේ. පිළිතුර 3

---

34. මූලික ප්‍රතික්‍රියාවක පෙළ පරීක්ෂණාත්මකව නිර්ණය කිරීමේ දී උෂ්ණත්වය නියත අගයක පවත්වා ගත යුතු වන්නේ,

(a) ප්‍රතික්‍රියාවෙහි පෙළ උෂ්ණත්වය මත රඳාපවතින නිසා ය.

(b) සක්‍රියන ශක්තිය උෂ්ණත්වය සමඟ වෙනස් වන නිසා ය.

(c) ප්‍රතික්‍රියාවෙහි යන්ත්‍රණය උෂ්ණත්වය සමඟ වෙනස් වන නිසා ය.

(d) ශීඝ්‍රතා නියතය උෂ්ණත්වය සමඟ වෙනස් වන නිසා ය.

යම් ප්‍රතික්‍රියාවක පෙළ සෙවීම සඳහා යොදා ගන්නා විදි ක්‍රමය වන්නේ පෙළ සෙවීමට අදාළ ප්‍රතික්‍රියාවන්හි විවිධ සාන්ද්‍රණවල දී එම ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතා ලබා ගැනීමය. මෙහි දි ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය වෙනස් කරන එකම සාධකය විය යුත්තේ අදාළ ප්‍රතික්‍රියකයෙහි සාන්ද්‍රණයයි. මෙහි දී අනෙකුත් ප්‍රතික්‍රියකයන්ගේ සාන්ද්‍රණ නියතව පවත්වා ගනී. තවද මෙය නියත උෂ්ණත්වයක් යටතේ සිදු කරනු ලැබේ. උෂ්ණත්වය වෙනස් වුවහොත් එහි ශීඝ්‍රතා නියතය (k) වෙනස් වෙයි. එවිට ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාවය ද වෙනස් වෙයි. එවිට ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය වෙනස් කරන විචල්‍යයන් දෙකක් පවතී. නමුත් ප්‍රතික්‍රියාවේ පෙළ සෙවීම සඳහා ශීඝ්‍රතාවය වෙනස් කරන එකම විචල්‍යය විය යුත්තේ අදාළ ප්‍රතික්‍රියකයෙහි සාන්ද්‍රණය වේ. (d) ප්‍රතිචාරය පමණක් නිවැරදි වේ.

❖ ප්‍රතික්‍රියාවෙහි පෙළ, සක්‍රීයන ශක්තිය හෝ එහි යාන්ත්‍රණය යන කිසිවක් උෂ්ණත්වය මත රඳා නොපවතී. පිළිතුර 5

---

35. පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති එතීන් සහ එතයින් පිළිබඳ ව සත්‍ය වේ ද?

(a) CaC_2 ජලය සමඟ ප්‍රතික්‍රියා කර එතයින් සාදයි.

(b) CaC_2 ජලය සමඟ ප්‍රතික්‍රියා කර එතීන් සාදයි.

(c) ඇමෝනිකෘත $AgNO_3$ සමඟ එතීන් ප්‍රතික්‍රියා කර අවක්ෂේපයක් ලබා දේ.

(d) ඇමෝනිකෘ Cu_2Cl_2 සමඟ එතයින් ප්‍රතික්‍රියා කර අවක්ෂේපයක්

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

ලබා දේ.

$$CaC_2 + H_2O \longrightarrow \underset{\text{එතයින්}}{C_2H_2} + Ca(OH)_2$$

- (a) සත්‍ය වන අතර (b) අසත්‍ය වේ.
- ඇමෝනිකෘත $AgNO_3$ සමග එතයින් ප්‍රතික්‍රියා කරනමුත් එතීන් ප්‍රතික්‍රියා නොකරයි. (c) අසත්‍ය වේ.

$$H—C\equiv C—H \xrightarrow[AgNO_3]{\text{ඇමෝනිකෘත}} Ag—C\equiv C—Ag$$

සිල්වර් ඇසිටලයිඩ් (සුදු)

ඇමෝනිකෘත Cu_2Cl_2 සමග එතයින් ප්‍රතික්‍රියා කර රතු - දුඹුරු අවක්ෂේපයක් ලබා දෙයි. (d) සත්‍ය වේ.

$$H—C\equiv C—H \xrightarrow[Cu_2Cl_2]{\text{ඇමෝනිකෘත}} Cu—C\equiv C—Cu$$

කියුප්‍රස් ඇසිටලයිඩ් (රතු - දුඹුරු)

පිළිතුර 4

36. හැලජන පිළිබඳ ව පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති සත්‍ය වන්නේ ද?

(a) කාණ්ඩයේ පහළට හැලජනවල තාපාංක වැඩි වේ.

(b) අනෙකුත් හැලජන මෙන් නොව, ෆ්ලුවොරීන්ට F_2 හි හැර, අන් සැමවිටම (-1) ඔක්සිකරණ අවස්ථාව ඇත.

(c) සියලු ම හැලජන හොඳ ඔක්සිහාරක වේ.

(d) ආවර්තිතා වගුවේ සියලු ම මූලද්‍රව්‍ය අතරින් ෆ්ලුවොරීන් වඩාත්ම ප්‍රතික්‍රියාශීලි වන නමුත් එය නිෂ්ක්‍රිය වායු සමඟ ප්‍රතික්‍රියා නොකරයි.

- කාණ්ඩයේ පහළට යන විට පරමාණුක අරය වැඩි වේ. එම නිසා කාණ්ඩයේ පහළට පරමාණුවල විශාලත්වය වැඩි වේ. මෙමගින් කාණ්ඩයේ පහළට හැලජන අණුවල විශාලත්වය වැඩි වන බැවින් අණුවල පෘෂ්ඨ ක්ෂේත්‍ර ඵලය වැඩි වීමෙන් අණු අතර ඇති වන

#ANYy Science
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

වැන්ඩවාල් බලවල ප්‍රබලතාවය වැඩි වේ. මෙමගින් කාණ්ඩයේ පහළට හැලජන වල තාපාංකය වැඩි වේ.

- විද්‍යුත්සෘණතාවයෙන් වැඩිම මූලද්‍රව්‍යය F වේ. ඒ නිසා එය කිසිම විටක + (ධන) ඔක්සිකරණ අංක නොදරයි. එයට ඇත්තේ $0(F_2)$ හා -1 ඔක්සිකරණ අවස්ථා පමණි.
- F විද්‍යුත්සෘතාවයෙන් වැඩිම මූලද්‍රව්‍යය වන බැවින් එය ඔක්සිකරණයට භාජණය නොවේ. එබැවින් එයට ඔක්සිහාරකයක් ලෙස හැසිරිය නොහැක. F හැර අනෙකුත් හැලජනවලට ඔක්සිහාරක ලෙස ක්‍රියා කළ හැක.
- He හා Ne යන නිෂ්ක්‍රිය වායු හැර අනෙකුත් සියලුම මූලද්‍රව්‍ය සමග F ප්‍රතික්‍රියා කරයි. (a) හා (b) පමණක් සත්‍ය වේ. පිළිතුර 1

---

37. සංවෘත දෘඪ බඳුනක් තුළ සිදුවන $C(s) + CO_2(g) \rightleftharpoons 2\,CO(g)$ ප්‍රතික්‍රියාව සඳහා 700°C හා 800°C හි දී CO(g) එල ප්‍රතිශත අනුපිළිවෙළින් 60% හා 80% වේ. පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති ඉහත ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් නිවැරදි වේ ද?

(a) ප්‍රතික්‍රියාව තාපාවශෝෂක වේ.

(b) ප්‍රතික්‍රියාව තාපදායක වේ.

(c) උෂ්ණත්වය අඩු කිරීම ආපසු ප්‍රතික්‍රියාවට හිතකර වේ.

(d) C(s) ඉවත් කිරීම මඟින් සමතුලිතතාව ප්‍රතික්‍රියක දෙසට නැඹුරු කළ හැක.

$$C(s) + CO_2(g) \rightleftharpoons 2\,CO(g)$$

ඉහත ප්‍රත්‍යාවර්ත ප්‍රතික්‍රියාවේ උෂ්ණත්වය වැඩි කරන විට CO(g) ඵලදාව වැඩි වීමට හේතුව මෙහි ඉදිරි ප්‍රතික්‍රියාව තාපාවශෝෂක වන බැවිනි. (ලේවැටලියර් මූලධර්මය අනුව මෙය වටහා ගන්න) ප්‍රත්‍යාවර්ත ප්‍රතික්‍රියාවක් තාපදායක ද නැතහොත් තාපාවශෝෂක ද යන්න සඳහන් කරන්නේ එහි ඉදිරි ප්‍රතික්‍රියාව අනුව වේ. මෙහි ඉදිරි ප්‍රතික්‍රියාව තාපාවශෝෂක වන බැවින් ඉහත ප්‍රතික්‍රියාව තාපාවශෝෂක ප්‍රතික්‍රියාවක් ලෙස නම් කරනු ලැබේ. (a) සත්‍ය වන අතර (b) අසත්‍ය වේ.

- මෙම ප්‍රත්‍යාවර්ත ප්‍රතික්‍රියාවෙහි ඉදිරි ප්‍රතික්‍රියාව තාපාවශෝෂක වන බැවින් පසු ප්‍රතික්‍රියාව තාපදායක වේ. (මෙය ඕනෑම ප්‍රත්‍යාවර්ත ප්‍රතික්‍රියාවක ලක්ෂණයක් වේ.) සමතුලිත පද්ධතියක උෂ්ණත්වය අඩු

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන වච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

කළ හොත් එම බලපෑම අවම කර ගැනීම සඳහා පද්ධතිය උෂ්ණත්වය වැඩිකර ගැනීමට පෙළඹේ (ලේ චැටලියර් මූලධර්මය). ප්‍රශ්නයෙහි සඳහන් සමතුලිත පද්ධතියේ උෂ්ණත්වය අඩු කළ හොත් උෂ්ණත්වය වැඩි කර ගැනීම සඳහා තාපදායක පසු ප්‍රතික්‍රියාව වැඩිපුර සිදුවේ. (c) සත්‍ය වේ.

- ප්‍රශ්නයෙහි සඳහන් සමතුලිත පද්ධතියෙන් වායුවක් ඉවත් කිරීම හෝ ඇතුළු කිරීම මගින් එහි පීඩනයෙහි වෙනසක් සිදුවන බැවින් සමතුලිතතාවය ද ඵල හෝ ප්‍රතික්‍රියක දෙසට යොමුවේ. නමුත් මෙම සමතුලිත පද්ධතියකින් ඝන ද්‍රව්‍යයක් ඉවත් කිරීම හෝ ඇතුලු කිරීම මගින් පීඩනයෙහි වෙනසක් නොවන බැවින් සමතුලිතතා ලක්ෂයෙහි ද වෙනසක් නොවේ. (d) අසත්‍ය වේ. පිළිතුර 5

---

38. සයික්ලොප්‍රොපේන් → ප්‍රොපීන් මූලික ප්‍රතික්‍රියාවකි.

පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති ඉහත ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් නිවැරදි වේ ද?

(a) ප්‍රතික්‍රියාවෙහි අර්ධ ආයු කාලය සයික්ලොප්‍රොපේන් සාන්ද්‍රණය මත රඳා පවතී.

(b) ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාව ප්‍රොපීන් සාන්ද්‍රණය මත රඳා නොපවතී.

(c) සක්‍රියන ශක්තියට වඩා වැඩි ශක්තියක් ඇති සයික්ලොප්‍රොපේන් අණුවල භාගය, උෂ්ණත්වය වැඩි වීමත් සමග වැඩි වේ.

(d) ප්‍රතික්‍රියාව ද්විඅණුක ගැටුමක් හරහා සිදු වේ. (අණුකතාව = 2)

- මෙය මූලික ප්‍රතික්‍රියාවක් බැවින් මෙහි අණුකතාවය 1 වන අතර පළමු පෙළ ප්‍රතික්‍රියාවක් වේ. (2016 - 8 ප්‍රශ්නයෙහි විවරණය බලන්න.)
- මෙය පළමු පෙළ ප්‍රතික්‍රියාවක් බැවින් එහි අර්ධ ආයු කාලය ප්‍රතික්‍රියක සාන්ද්‍රණයෙන් ස්වායත්ත වේ. (ශුන්‍ය පෙළ හා දෙවන පෙළ ප්‍රතික්‍රියාවන්හි එසේ නොවේ.)
- ප්‍රතික්‍රියා ශීඝ්‍රතාවය ප්‍රතික්‍රියක සාන්ද්‍රණය මත රඳා පවතී. (ශුන්‍ය පෙළ හැර) මෙහි දී ප්‍රොපීන් ප්‍රතික්‍රියකයක් නොවන බැවින් ශීඝ්‍රතාවය එහි සාන්ද්‍රණය මත රඳා නොපවතී.
- ඕනෑම ප්‍රතික්‍රියාවක උෂ්ණත්වය වැඩි කිරීමේ දී සක්‍රියන ශක්තියට වඩා වැඩි ශක්තියක් ඇති අණුවල භාගය වැඩි වේ. මෙය ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාවය ඉහළ යාමට බලපායි. පිළිතුර 2

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

39. පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති 3-හෙක්සීන් පිළිබඳ ව සත්‍ය වේ ද?

(a) ජ්‍යාමිතික සමාවයවිකතාව නොපෙන්වයි.

(b) ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි.

(c) H_2/Pd සමඟ ප්‍රතික්‍රියා කරවූ විට ලැබෙන සංයෝගය ප්‍රකාශ සමාවයවිකතාව නොපෙන්වයි.

(d) HBr සමඟ ප්‍රතික්‍රියා කරවූ විට ලැබෙන සංයෝගය ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි.



3-හෙක්සීන්

- මෙහි ද්විත්ව බන්ධනය සහිත කාබන් පරමාණු දෙකට අසමාන කාණ්ඩ දෙක බැගින් පවතින හෙයින් ජ්‍යාමිතික සමාවයවිකතාව පෙන්වයි.



cis trans

- මෙහි අසමමිතික කාබන් පරමාණුවක් නොමැති බැවින් ප්‍රකාශ සමාවයවිකතාව නොපෙන්වයි.

- මෙම සංයෝගය H_2/Pd සමඟ ප්‍රතික්‍රියාව පහත දැක්වේ.

$$CH_3CH_2CH=CHCH_2CH_3 \xrightarrow{H_2/Pd} CH_3CH_2CH_2CH_2CH_2CH_3$$

- ලැබෙන ඵලයෙහි අසමමිතික කාබන් පරමාණුවක් නොමැති බැවින් ප්‍රකාශ සමාවයවිකතාව නොපෙන්වයි.



#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

⌖ HBr සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලයෙහි Br සම්බන්ධ කාබන් පරමාණුව අසමමිතික කාබන් පරමාණුවක් වේ. එබැවින් මෙහි දී ලැබෙන ඵලය අසමමිතික අණුවකි. මෙය ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි. පිළිතුර 3

---

40. නයිට්‍රජන් චක්‍රය පිළිබඳ ව පහත සඳහන් කුමන වගන්තිය / වගන්ති නිවැරදි වන්නේ ද?

(a) වායුගෝලයේ ඇති N_2 තිර වන්නේ වායුගෝලීය හා කාර්මික තිර කිරීමෙන් පමණි.

(b) වායුගෝලීය තිර කිරීමේ දී N_2 ඔක්සිහරණය වේ.

(c) කාර්මික තිර කිරීමේ දී N_2 ඔක්සිකරණය වේ.

(d) වායුගෝලීය තිර කිරීමේ දී සෑදෙන නයිට්‍රේට හා නයිට්‍රයිට වර්ෂාපතනය නිසා පොළොව මත තැන්පත් වූ විට ඒවා ප්‍රෝටීන් සෑදීමට ශාක මඟින් යොදා ගනී.

⌖ වායු ගෝලයේ ඇති N_2 තිර වන්නේ වායුගෝලීය හා කාර්මික තිර කිරීමට අමතරව ජෛව රසායනික තිර කිරීම මගිනි.

⌖ වායුගෝලීය තිර කිරීම සඳහා විදුලි කෙටීමේ දී මුක්ත වන අධික ශක්තිය උපයෝගී වෙයි. මෙහි දී N_2 හි ඔක්සිකරණ අංකය 0 සිට +5 බවට පත්වේ. එනම් N_2 ඔක්සිකරණය වෙයි.

$$N_2(g) + O_2(g) \longrightarrow 2\,NO(g)$$

$$2\,NO(g) + O_2(g) \longrightarrow 2\,NO_2(g)$$

$$4\,NO(g) + 2\,H_2O(l) \longrightarrow 4\,\underset{(+5)}{HNO_3}$$

⌖ කාර්මික N_2 තිර කිරීම සිදු කරන ප්‍රධාන ක්‍රමය වන්නේ හේබර් ක්‍රමයයි. මෙහි දී $N_2 \rightarrow NH_3$ බවට පත් කරයි. මෙය ඔක්සිහරණ ප්‍රතික්‍රියාවකි.

$$N_2(g) + 3\,H_2(g) \rightleftharpoons 2\,NH_3(g)$$

$$0 \xrightarrow{\text{ඔක්සිහරණය}} -3$$

(d) පමණක් සත්‍ය වේ. පිළිතුර 5

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

41.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
$MgCO_3$ වලට වඩා $BaCO_3$ තාපස්ථායි වේ.	දෙවන කාණ්ඩයේ කැටායනවල ධ්‍රැවීකරණ බලය කාණ්ඩයේ පහළට යන විට අඩු වේ.

- කැටායනවල ආරෝපණය නියතව පැවතුන ද කාණ්ඩය දිගේ පහළට යන විට පරමාණුක අරය වැඩි වේ. එමගින් කැටායනයේ ආරෝපණ ඝනත්වය අඩු වේ. එම නිසා ඇනායනයෙහි ඉලෙක්ට්‍රෝන වලාව කැටායනය දෙසට ඇද එය විකෘති කිරීමේ හැකියාව අඩු වේ. එනම් කාණ්ඩ දිගේ පහළට කැටායන වල ධ්‍රැවීකරණ බලය අඩු වේ. එවිට ඇනායනයෙන් ඔක්සයිඩ් අයනයක් කැටායන වෙතට ඇද ඔක්සයිඩය (MO) සෑදීමේ හැකියාව අඩු වේ.

උදා:- $MCO_3(s) \longrightarrow MO(s) + CO_2(g)$

- එම නිසා දෙවන කාණ්ඩයේ කාබනේටවල ඉහත ආකාරයට සිදුවන තාප වියෝජනය කාණ්ඩය දිගේ පහළට අඩු වේ. එනම් කාණ්ඩය දිගේ පහළට වියෝජන උෂ්ණත්වය වැඩි වේ. පිළිතුර 1

42.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
ඇමීනයක නයිට්‍රජන් මත ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගලය H^+ සමඟ බන්ධනයක් සෑදීමට ඇති ප්‍රවණතාව ඇල්කොහොලයක ඔක්සිජන් මත ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගලයට වඩා අඩු ය.	ඔක්සිජන්වලට වඩා නයිට්‍රජන් විද්‍යුත් සෘණතාවයෙන් අඩු ය.

$$R-\ddot{N}H_2 + H^+ \longrightarrow R-NH_3^+$$

ඇමීනය

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot



ඇල්කොහොලය

ඔක්සිජන්වලට වඩා නයිට්‍රජන්හි විද්‍යුත්සෘණතාවය අඩුය. එබැවින් ඉහත ආකාරයට ඔක්සිජන් මත ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගලක් H^+ ට දායක කිරීමට ඇති හැකියාව නයිට්‍රජන්ට සාපේක්ෂව අඩුය. පිළිතුර 4

43.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
උත්ප්‍රේරකයක් යෙදීමෙන් සමතුලිතතාවයේ ඇති ප්‍රතික්‍රියාවක් ඉදිරියට (එනම් සමතුලිත ලක්ෂ්‍යය දකුණට විස්ථාපනය කිරීම) පෙළඹවීම කළ හැක.	උත්ප්‍රේරකය මඟින් ඉදිරි ප්‍රතික්‍රියාව සඳහා පමණක් අඩු සක්‍රියන ශක්තියක් ඇති මාර්ගයක් සපයයි.

උත්පේරක මගින් සමතුලිතතා ලක්ෂයෙහි වෙනසක් සිදු නොවේ. උත්තේජක මගින් කළ හැක්කේ ප්‍රත්‍යාවර්ත ප්‍රතික්‍රියාවල ශීඝ්‍රතාවය වෙනස් කිරීමය. එමගින් සමතුලිතතාවයට පත්වීමට ගත වන කාලය අඩු කළ හැකිය. මෙහි දී ඉදිරි ප්‍රතික්‍රියාවෙහි මෙන්ම පසු ප්‍රතික්‍රියාවේ ද සක්‍රීයන ශක්තිය අඩු වේ. පිළිතුර 5

44.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
CO_3^{2-} හා SO_3^{2-} අයනවලට සමාන හැඩයන් ඇත.	CO_3^{2-} හා SO_3^{2-} යන දෙකෙහිම මධ්‍ය පරමාණුවේ එකසර ඉලෙක්ට්‍රෝන යුගල් ඇත.

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

CO_3^{2-} හි ලුවිස් ව්‍යුහය



හැඩය
තලීය ත්‍රිකෝණාකාර

SO_3^{2-} හි ලුවිස් ව්‍යුහය



හැඩය - පිරමිඩීය

පිළිතුර 5

45.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
$CH_3CH_2CH_2OH$ හි තාපාංකය CH_3CH_2CHO හා CH_3COCH_3 හි තාපාංකවලට වඩා වැඩි ය.	කාබන් ඔක්සිජන් ද්විත්ව බන්ධනය, කාබන් ඔක්සිජන් තනි බන්ධනයට වඩා ශක්තිමත් ය.

මධ්‍යසාරවල අඩංගු –OH කාණ්ඩය හේතුවෙන් එම අණු අතර පවතින අන්තර් අණුක ආකර්ෂණ බල වර්ගය වන්නේ හයිඩ්‍රජන් බන්ධන වේ. ඇල්ඩිහයිඩ හා කීටෝනවල පවතින අන්තර් අණුක ආකර්ෂණ බල වර්ගය ස්ථිර ද්වි ධ්‍රැව ආකර්ෂණ බල වේ. හයිඩ්‍රජන් බන්ධන, ස්ථිර ද්වි ධ්‍රැව ආකර්ෂණවලට වඩා ප්‍රබල බැවින් මධ්‍යසාරවල තාපාංකය අනුරූප ඇල්ඩිහයිඩ හා කීටෝනවලට වඩා වැඩිය. පළමු ප්‍රකාශය මෙන්ම දෙවන ප්‍රකාශය ද සත්‍ය වේ. පිළිතුර 2

46.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
ඒකලිත පද්ධතියක් තුළ ස්වයංසිද්ධව සිදු වන ප්‍රතික්‍රියාවක් සඳහා සැමවිටම සෘණ ගිබ්ස් ශක්ති වෙනසක් ඇත.	ඒකලිත පද්ධතියක් තුළ සිදු වන ක්‍රියාවලියක් පිටත සිට වෙනස් කළ නොහැක.

- ඒකලිත පද්ධතියක් යනු මායිම හරහා පදාර්ථය හා ශක්තිය සංක්‍රමණය නොවන පද්ධතියකි. මෙම පද්ධතිවල මායිම තාපය ඇතුළු අනෙක් සියලු ශක්ති ප්‍රභේද සඳහා පරිවාරකයක් ලෙස ක්‍රියා කරයි. එබැවින් මෙම පද්ධති තුළ සිදුවන ක්‍රියාවලි පිටත සිට වෙනස් කළ නොහැක. දෙවන ප්‍රකාශය සත්‍ය වේ.
- ප්‍රතික්‍රියාවක ගිබ්ස් ශක්ති වෙනස (ΔG) පහත සමීකරණයෙන් ලබා ගනී.

$$\Delta G = \Delta H - T\Delta S$$

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

යම් ප්‍රතික්‍රියාවක නියත උෂ්ණත්වයේ දී හා පීඩනයේ දී, ΔG සෘණ අගයක් ගනී නම් එම ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ සිදු වේ. $\Delta G = +$ වේ නම් ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ නොවන අතර $\Delta G = 0$ වේ නම් පද්ධතිය සමතුලිතතාවයෙහි පවතී. ඒකලිත පද්ධතියක උෂ්ණත්වය හා පීඩනය නියතව පවත්වා ගත නොහැකි නිසා ප්‍රතික්‍රියාවෙහි ΔG වෙනස් විය හැකිය. පිළිතුර 4

47.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
තෙල් හා මේද සමග NaOH හෝ KOH ප්‍රතික්‍රියාවෙන් සෑදෙන මේද අම්ලවල සෝඩියම් හෝ පොටෑසියම් ලවණ, බහුල ලෙස භාවිත වන සබන්වල අඩංගු වේ.	ජලීය NaOH හෝ KOH සමග එස්ටරයක් ප්‍රතික්‍රියාවෙන් කාබොක්සිලික් අම්ලයේ සෝඩියම් හෝ පොටෑසියම් ලවණය හා මද්‍යසාරය ලැබේ.

තෙල් හෝ මේදය NaOH හෝ KOH ද්‍රාවණයක් සමග 95°C පමණ රත් කිරීමෙන් සබන් නිපදවා ගනී. මෙහි දී, තෙල් හෝ මේදයෙහි අඩංගු ග්ලිසරෝල් එස්ටර ජල විච්ඡේදනය වී කාබනික අම්ලවල සෝඩියම් හෝ පොටෑසියම් ලවණ (සබන්) හා ග්ලිසරෝල් බවට පත් වේ. ග්ලිසරෝල් යනු මධ්‍යසාරයකි.

උදා:-



ග්ලිසරෝල් එස්ටර ග්ලිසරෝල් කාබනික අම්ලවල සෝඩියම් ලවණ (සබන්)

පිළිතුර 1

48.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
C_6H_5OH සෑදීමට NaOH සමග C_6H_5Br පහසුවෙන් ප්‍රතික්‍රියා නොකරයි.	ෆීනයිල් කාබොකැටායනය ඉතා ස්ථායී වේ.

❖ C_6H_5Br හි සම්ප්‍රයුක්ත ව්‍යුහ පහත දැක්වේ.

#ANYy Science
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා,ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot



❖ ඉහත සම්පයුක්ත ව්‍යුහ අනුව C–Br බන්ධනය ද්වීත්ව බන්ධන ස්වභාවයක් උසුලයි. එබැවින් C–Br බන්ධනය සැළකිය යුතු තරම් ශක්තිමත් බන්ධනයකි. එබැවින් ඇලිපැටික හේල්යිඩවල මෙන් C_6H_5Br ඇතුළු ඇරෝමැටික හේලයිඩවල න්‍යුක්ලියෝපිලක ආදේශ ප්‍රතික්‍රියා සිදු නොවේ. පළමුවැනි ප්‍රකාශය සත්‍ය වේ.

❖ ෆීනයිල් කාබෝකැටයනය යනු $C_6H_5^+$ අයනය වේ. එහි ව්‍යුහය පහත දැක්වේ.



මෙහි ධන ආරෝපනය සහිත කාබන් පරමාණුව පිළිබඳව අවධානය යොමු කරන්න. එම කාබන් පරමාණුවට ඇත්තේ බන්ධන 3 ක් පමණි. එබැවින් ධන ආරෝපණය සහිත කාබන් පරමාණුවෙහි සංයුජතා ඉලෙක්ට්‍රෝන ගණන 6 කි. එය සම්පයුක්ත ව්‍යුහ සාදන්නේ නම් කළ යුතු වන්නේ ප්‍රථමයෙන් එයට සම්බන්ධ π බන්ධනයෙහි ඉලෙක්ට්‍රෝන යුගල ලබා ගැනීමයි.



ඉහත දක්වා ඇති පරිදි π බන්ධනයෙහි ඉලෙක්ට්‍රෝන යුගල ලබා ගත් පසු ද එම කාබන් පරමාණුවෙහි සංයුජතා ඉලෙක්ට්‍රෝන ගණන 6 ක් වේ. එනම් මෙමගින් එහි අෂ්ඨක සම්පූර්ණ නොවේ. එබැවින් ෆීනයිල් කාබොකැටායනයට සම්ප්‍රයුක්ත ව්‍යුහ සෑදිය නොහැකිය. (බෙන්සීන් වලය සම්ප්‍රයුක්ත ව්‍යුහ සාදන්නේ එහි චක්‍රීය සංයුග්මනය ආරක්ෂා වන පරිදි වේ. ඉහත දක්වා ඇති ආකාරයට නොමැතිව වෙනත් π බන්ධනයක් හරහා සම්පයුක්ත ව්‍යුහ සෑදීමට උත්සහා දැරුවහොත් ඇරෝමැටික වලයෙහි චක්‍රීය සංයුග්මනය බිඳ වැටෙන බව ඔබට වටහාගත හැකි වෙයි.) එබැවින් ෆිනයිල් කාබොකැටායනය අස්ථායි වේ. පිළිතුර 3

49.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්න පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන වච්/ක්ලික් කරන්න

https://t.me/ANYyScienceStudentHelpbot

දුබල අම්ලයක ජලීය ද්‍රාවණයක් තනුක කරන විට විඝටනය වූ අම්ල අණුවල භාගය හා මාධ්‍යයේ pH අගය යන දෙකම වැඩි වේ.	දුබල අම්ල අණුවල විඝටනය සිදු වන්නේ අම්ල විඝටනය සිදු වන්නේ අම්ල විඝටන නියතය K_a නියතව පවතින පරිදි ය.

දුබල අම්ලයක විඝටනය සම්බන්ධයෙන් ඔස්ට්වල්ඩ් තනුකරණ නියමය $Ka = C\alpha^2$ මගින් දක්වේ. මෙහි Ka යනු දුබල අම්ලයෙහි විඝටන නියතය වෙයි. එය උෂ්ණත්වය මත පමණක් රඳා පවතින නියතයකි. C යනු දුබල අම්ලයෙහි සාන්ද්‍රණය වන අතර α යනු එහි විඝටන ප්‍රමාණය වේ. මෙම සමීකරණය අනුව දුබල අම්ලයෙහි සාන්ද්‍රණය අඩු වන විට එහි විඝටන ප්‍රමාණය වැඩි වේ. එසේම අම්ලයෙහි සාන්ද්‍රණය වැඩි වන විට එහි විඝටන ප්‍රමාණය අඩු වෙයි. එසේ වන්නේ Ka නියතව තබා ගැනීමටය. දෙවන ප්‍රකාශය සත්‍ය වේ.

⌖ ප්‍රබල අම්ලයක ජලීය ද්‍රාවණයක් තනුක කරන විට එහි සාන්ද්‍රණය අඩුවන බැවින් විඝටනය වූ අම්ල අණුවල භාගය (විඝටන ප්‍රමාණය) වැඩි වේ. මෙහි දී අම්ල සාන්ද්‍රණය අඩු වන බැවින් ඉන් ද්‍රාවණයට ලැබෙන H^+ සාන්ද්‍රණය අඩු වේ. H^+ සාන්ද්‍රණය අඩු වන විට PH අගය වැඩි වේ. පළමු ප්‍රකාශය සත්‍ය වේ. පිළිතුර 1

50.

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
සූර්යාලෝකය ඇති විට හරිත ශාක තුළ CO_2 තිර වේ.	වායුගෝලයේ CO_2 මට්ටම ඉහළ යාම හරිත ශාක මගින් පාලනය කළ නොහැක.

සූර්යාලෝකය ඇති විට ශාක ප්‍රභාසංශ්ලේෂණය මගින් වායුගෝලයෙහි පවතින CO_2 ශාකය තුල දී ග්ලූකෝස් බවට පත් කරයි. මෙලෙස වායුගෝලයෙහි පවතින ශාකවලට කෙලින්ම භාවිතයට නොහැකි CO_2 ශාකවල භාවිතයට ගත හැකි ග්ලූකෝස් බවට පත් කිරීම CO_2 තිර කිරීම ලෙස හඳුන්වයි. පිළිතුර 3

#ANYy Science Beta
@ANYyScienceStudentHelpBot

උසස් පෙළ විද්‍යා.ගණිත විෂය ධාරාවන්ට අදාළ සියලුම සටහන්/ප්‍රශ්ණ පත්‍ර/විවරණ හා තවත් බොහෝ දේ ලබා ගැනීමට මෙතන ටච්/ක්ලික් කරන්න